# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2105/31 - 2019 ජනවාරි මස 09 වැනි බදාදා - 2019.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25 අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වන ලියාපදිංචි අංක පී. වී. 66705 දරන කාට්සු - හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (KIU) ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ (2018 ඔක්තෝබර් මස 01 වන දින අංක 2091/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයෙන් අවසන් වරට සංශෝධිත) 2016 අප්‍රේල් මස 08 වැනි දින අංක 1961/34 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනය, එහි II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''භෞතීය විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**I වන උපලේඛනය**

***කොන්දේසි***

කාට්සු - හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රෙනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (KIU) ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

(අ) අධ්‍යයන ක්‍රියාකාරකම් මගින් (SLQF-9 වන ස්ථරය) වන හෙද අධ්‍යාපනපති සහ හෙද කළමනාකරණපති උපාධි සම්බන්ධයෙන් මෙහි පහත දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා යෝග්‍යතා ක්ෂේත්‍රයෙහි (SLQF) නියම කොට ඇති ආකාරයෙන් -

(i) පිළිගත් ඕනෑම විශ්වවිද්‍යාලයකින් හෙද විද්‍යාවේදී ගෞරව උපාධියේ SLQF 6 වන ස්ථරය සාර්ථක ලෙස සම්පූර්ණ කළ හෙදියන්, හෙද සොයුරියන් හෝ ප්‍රධාන හෙද නිලධාරීන් වීම ; හෝ

(ii) පිළිගත් ඕනෑම විශ්වවිද්‍යාලයකින් හෙද විද්‍යාවේදී උපාධිය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම හෝ හෙද උපාධියේ SLQF 5 වන ස්ථරය හා හෙද ක්ෂේත්‍රයේ අධ්‍යයන සම්භාර 30 ක් සාර්ථක ලෙස අවසන් කිරීම.

යන අවම ඇතුළත්කර ගැනීමේ සුදුසුකමට අනුකූල විය යුතු අතර යෝග්‍යතා නාමයට වෙනත් යෝග්‍යතා ක්ෂේත්‍රයක් සම්බන්ධ කරනු නොලැබිය යුතු ය ;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) අධ්‍යයන ක්‍රියාකාරකම් සහ පර්යේෂණ සංරචක මගින් (SLQF 10 වන ස්ථරය) වන හෙද විද්‍යාපති උපාධි පාඨමාලාව සම්බන්ධයෙන් මෙහි පහත දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා යෝග්‍යතා ක්ෂේත්‍රයෙහි (SLQF) නියම කොට ඇති ආකාරයෙන් -

(i) පිළිගත් ඕනෑම විශ්වවිද්‍යාලයකින් හෙද විද්‍යාවේදී ගෞරව උපාධියේ SLQF 6 වන ස්ථරය සාර්ථක ලෙස සම්පූර්ණ කළ හෙදියන්, හෙද සොයුරියන් හෝ ප්‍රධාන හෙද නිලධාරීන් වීම ; හෝ

(ii) පිළිගත් ඕනෑම විශ්වවිද්‍යාලයකින් හෙද අධ්‍යාපනපති හෝ හෙද සේවා කළමනාකරණපති උපාධියේ SLQF 9 වන ස්ථරය සාර්ථක ලෙස අවසන් කිරීම ; හෝ

(iii) පිළිගත් ඕනෑම විශ්වවිද්‍යාලයක හෙද විද්‍යාවේදී ගෞරව උපාධියක් දරන හෙද විද්‍යාවේදී උපාධිධරයකු වීම (SLQF 6 වන ස්ථරය) ; හෝ

(iv) නිශ්චිත බලධරයා විසින් පිළිගත් අදාළ විෂයය ක්ෂේත්‍රයකින් SLQF 6 හෝ ඊට ඉහළ ස්ථරයක් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූල විය යුතු අතර යෝග්‍යතා නාමයට වෙනත් යෝග්‍යතා ක්ෂේත්‍රයක් සම්බන්ධ කරනු නොලැබිය යුතු ය.

II වන උපලේඛනය

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *උපාධිය* | *උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
| හෙද අධ්‍යාපනපති | එම්. එන්. ඊඩියු |
| හෙද කළමනාකරණපති | එම්. එන්. මැනේජ්මන්ට් |
| හෙද විද්‍යාපති | එම්. එස්. සී. (හෙද) |

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

01 - 588/1

---

එල්.ඩී.බී. 21/78 (x)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25 අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී වී 101137 දරන සමාගමක් වන එස් එල් ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මේ පනත යටතේ සාදන ලද සහ (2018 අගෝස්තු මස 10 වන දින අංක 2083/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයෙන් අවසන් වරට සංශෝධිත) 2016 දෙසැම්බර් මස 02 වැනි දින අංක 1995/39 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන ''තාක්ෂණවේදී විද්‍යුත් ගෞරව උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**I උපලේඛනය**

***කොන්දේසි***

එස් එල් ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද තොරතුරු සහ සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉන්ජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයන්ට සහ රසායන විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සහ උසස් ගණිතය යන විෂයයන් අතරින් කවර හෝ විෂයයකට 'S' (සාමාන්‍ය) සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූලව කටයුතු කළ යුතු ය.

II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය පිළිබඳ කෙටි යෙදුම* |
|---|---|
| තොරතුරු සහ සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ඉංජිනේරු) (තොරතුරු සහ සන්නිවේදන ඉංජිනේරු) |

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

01 - 588/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.